වත්කම් බැරකම් ප්‍රකාශ නොකරන අපේක්ෂකයන්ට අල්ලස් කොමිසමෙන් නඩු පවරනවා

පැෆරල් විධායක අධ්‍යක්ෂ

නුවන් හෙට්ටිආරච්චි

පිරිසුදු දේශපාලන සංස්කෘතියක් සඳහා පළමු පියවර තැබීමට සියලුම දේශපාලකයන් විසින් තම වත්කම් බැරකම් ප්‍රකාශ කළ යුතු බවත් එසේ නොකරන අපේක්ෂකයන්ට අල්ලස් කොමිසමේ නඩු ගොනු කිරීමට කටයුතු කරන බවත් පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා පවසයි.

මේ වන විට පැෆරල් සංවිධානය ලබා දී ඇති වත්කම් බැරකම් ප්‍රකාශ ගණන 08ක් බව සඳහන් කරන හෙතෙම වත්කම් බැරකම් ලබා දෙන සංස්කෘතියක් ඇති කිරීම සහ අනවශ්‍ය ලෙස මැතිවරණයට ඉදිරිපත් වන අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව අඩු කිරීම මෙහි අරමුණ බවත් 'මව්බිම'ට පැවැසීය.